# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 7,936 — 1932ක්වූ ජූලි මස 22 වෙනි දිනවූ සිකුරාදා.

## Part IV. — හතරවෙනි කාණ්ඩය.

### උපාඞ්ග නීති.

No. G. 166.

"1901කේ බල්ලන් ලියා පදිංචිකිරීමේ ආඥාපණත."

නුවරඑළිය පළාතේ සියලුම සනීපාරක්ෂාසභා සඳහා 1901කේ අංක 25 දරණ බල්ලන් ලියාපදිංචිකිරීමේ ආඥාපණතේ 5වන වගන්තියේ විධිවිධාන අනුව නුවරඑළිය පළාතේ සනීපාරක්ෂාසභාවේ ප්‍රධාන තැන විසින් සාදනලද උපනීතියි.

නුවරඑළිය පළාතේ සනීපාරක්ෂාසභා නගර වර්ෂ 1902ක්වූ අප්‍රේල් මස 18වන දින නිකුත් අංක 5,845 දරණ ආණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පලවූ වර්ෂ 1902ක්වූ අප්‍රේල් මස 14වන දින දරණ ප්‍රකාශ පත්‍රයෙන් එකී ආඥාපණතේ කාර්‍ය්‍යයට යටහත් කරණලදී,

ඩබ්ලිව්. ජේ. ඇල්. රොජර්සන්,
නුවරඑළිය පළාතේ සනීපාරක්ෂකසභාවේ ප්‍රධාන තැන.

වර්ෂ 1932ක්වූ ජූනි මස 15වන දින
නුවරඑළියේදීය.

### උපනීති.

1. නුවරඑළිය පළාතේ යම් සනීපාරක්ෂා නගරයක සීමා තුළ තබාගෙන සිටින සෑම බල්ලා හෝ බැල්ලී ගැන ඒ සතාගේ භාරකාරයා නොහොත් අයිතිකාරයා වර්ෂයක් පාසා ලියාපදිංචිකිරීම සඳහා රුපියලකුත් ශත පනහකුත් ගෙවිය යුතුයි. මෙම ව්‍යවස්ථාවේ අදහස් සඳහා එක් අවුරුද්දක අප්‍රේල් මාසේ 1වනි දින පටන් ඊලඟ අවුරුද්දේ මාර්තු මස 31වන දින දක්වා වර්ෂයකැයි ගණන්ගනු ලැබේ.

2. නගරයතුළ සෑම ගෙයිම පදිංචිකාරයා, එක් එක් රුද්දේ ජනවාරි මස 31වන දිනට මත්තෙන් ලියාපදිංචිකිරීමේ ගෙවිල්ල එකතුකිරීමට සනීපාරක්ෂා සභාවේ ප්‍රධාන තැන විසින් පත්කරනු ලබන (මෙහි පසුව අයකරන්නායයි කියනු ලබන) අයට එබඳු ගෙය නොහොත් එය පිහිටි ස්ථානයතුළ තබාගෙන සිටින එක් එක් බල්ලා හෝ බැල්ලී ගැන මිට යාකර තිබෙන A අක්ෂරය දරණ ආකෘතිපත්‍රයෙහි උවමනාකරන කරුණු සපයා දියයුතුයි.

3. ඉහතකී අයකරන්නාට නියම ගෙවිල්ල ගෙවූවිට, B අක්ෂරය දරණ ආකෘතිපත්‍රයෙහි ලියාපදිංචිකිරීමේ සහතික පත්‍රයක් ලියාදිය යුතුයි.

4. (1) (a) අනිකුදු බල්ලන්වද රෝගය බෝවීමට මාර්ගයක් වන් හැකිතරම් රෝගයකින් පෙළෙන්නේයයි අයකරන්නා කල්පනාකරන නොහොත් (b) වයස, අසනීප හෝ තුවාල නිසා ජීවත්වීමට නුසුදුසුයයි ඔහු කල්පනාකරන, යම් බල්ලකු හෝ බැල්ලියක් ගැන ලියාපදිංචිකිරීමේ සහතික පත්‍රයක් නොදෙන්නට හෝ (2) සුදුසුයයි ඔහු කල්පනාකරන නියම වලට යටහත්කොට එබඳු සහතික පත්‍රය දෙන්නට හෝ ඔහුට පුළුවන. එසේ සහතිකපත්‍රය නොදීම ගැන හෝ එබඳු නියම ගැන, නොසතුටුවූ යම් අයිතිකාරයකුට ඊට විරුද්ධව සනීපාරක්ෂා සභාවේ ප්‍රධාන තැනට ඇපෑල් ගත හැකිය. එය ස්ථිර කරන්නට, වෙනස්කරන්නට හෝ අවලංගුකරන්නට ඒ ප්‍රධානතැනට පුළුවන.

5. සෑම ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රයේම පහත දක්වන නියමවල් අඩංගුසා තිබිය යුතුයි, එනම් :—

(a) සනීපාරක්ෂා සභාවේ ප්‍රධාන තැනගේ කල්පනාවේ හැටියට බල්ලා ජීවත්වීමට නුසුදුසු තරම් අබ්බාගාතව හෝ රෝගයකින් පෙළෙමින් සිටිනම් හෝ ;

(b) බල්ලාට උගේ ස්වාමියා නිතරම හිංසා කරන්නේය කියා හෝ උං නොසලකා හැර සිටින්නේය කියා හෝ ප්‍රධාන තැනට ඒත්තුයානම් හෝ ;

(c) බල්ලා යම් බෝවෙන හෝ පැතිරෙන රෝගයකින් පෙළෙනාවස්ථාවකදී වෙන අයට අයිති බල්ලන් සමග ගැවසෙන්නට උගේ ස්වාමියා උංට ඉඩහරීනම් හෝ ;

සනීපාරක්ෂා සභාවේ ප්‍රධාන තැනට මේ සහතිකපත්‍රය අවලංගුකරන්නට සිද්ධවිය හැකිය.

6. යම් බල්ලකු හෝ බැල්ලියක් ගැන (a) සහතික පත්‍රයක් නොදී හැරියොත් හෝ (b) දෙනලද සහතිකපත්‍රයකට සම්බන්ධ කරණලද නියමවල් ඉෂ්ටනොකළ නිසා ඒ සහතික පත්‍රය අවලංගුකළොත් හෝ, ඒ සතාගේ භාරකාරයා නොහොත් අයිතිකාරයා, එසේකරන ලෙස දැනුම්දෙනු ලැබූ විට, දැන්වීමේ සඳහන් වේලාවට සනීපාරක්ෂා පරීක්ෂක තැනගේ කන්තෝරුවට ඒ සතා ගෙනැවිත් එහිදී උං බාරගැනීමට බලයලත් සනීපාරක්ෂා සභාවේ නිලධාරී කෙනකුට උං බාරදිය යුතුවේ. එවිට සනීපාරක්ෂා සභාවේ ප්‍රධාන තැන නියමකරන අන්දමක් එබඳු බල්ලන්ට කළයුතුයි.

### A ආකෘතිපත්‍රය.

**බල්ලන් පිළිබඳ උපනීතිවල නියමවූ වාර්තාව.**

ගෙයි අංකය :————.
වීදිය :————.
ගෘහමූලිකයාගේ නම :————.

| තබාගත් බල්ලන් ගණන | ලක්ෂණ | | | | | අයිතිකාරයාගේ නම | [illegible] |
|---|---|---|---|---|---|---|---|
| | වර්ගය | පිරිමි සතාද, ගැණු සතාද | පාට | බෙල්ලේ මහත | විශේෂ ලක්ෂණ | | |
| | | | | | | | |

බාරදුන් දින :————.
වර්ෂ 19—ක්වූ————මස——වන දින
නුවරඑළියේදීය.

————.
ගෘහමූලිකයාගේ අත්සන.

මෙහි ඉහළ උප ලේඛනය පූරවා එක් සතියක් ඇතුළත ආපසු එවන ලෙස ඉහත සඳහන් ගෘහමූලිකයාට මෙයින් නියම කරනු ලැබේ. එසේ නොකරන කෙනෙක් රුපියල් 20ක දඩයකට යටහත් වේ.

————.
ප්‍රධාන නැන.

වර්ෂ 19—ක්වූ————මස——වන දින
නුවරඑළියේ කච්චේරියේදීය.

### B ආකෘතිපත්‍රය.

**බල්ලන් ලියාපදිංචිකිරීමේ සහතිකපත්‍රය.**

වීදිය :————. ලියාපදිංචිකළ අංකය :—

අංක————දරණ නමගෙයි වාසයකරන ———————— අද දින පහත දක්වන ලක්ෂණ ඇති බල්ලකු/බැල්ලියක් මේ කන්තෝරුවේ ලියාපදිංචිකළ බවද ඒ ගැන ලියාපදිංචිකිරීමේ ගෙවිල්ලක් වශයෙන් රු.————ක් ගෙවූ බවද මෙයින් සහතිකකරමි.

**බල්ලාගේ ලක්ෂණ.**

වර්ගය :————.
පිරිමි සතාද ගැණු සතාද :————.
පාට :————.
බෙල්ලේ මහත :————.
විශේෂ ලක්ෂණ :————.

මෙම සහතික පත්‍රය වර්ෂ 19—ක්වූ මාර්තු මස 31වන දින වනතුරු වලංගුව පැවතේ :————.

————.
ප්‍රධාන නැන.

වර්ෂ 19—ක්වූ————මස——වන දින
නුවරඑළියේ කච්චේරියේදීය.

---

## ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම.

**Badulla No. 128.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1932ක්වූ සැප්තැම්බර් මස 7වෙනි දිනවූ බදාදා පෙරවරු 10ට වැල්ලවායේ නානායමේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුළු පලාතේ වැල්ලවාය සහ බුත්තල කොඨාසවල පිහිටා තිබෙන බිම්කැබලි මින්.

| නො. | ඉඩමේ නම. | ඉල්ලම්කාරයා | භුක්තිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිළ, රු. |
|---|---|---|---|---|---|---|
| | **අන්තිම ටෝපෝ සිතියමේ නො. 41. ගම—වැල්ලවායේ සිත්තරම්පලාතකෝරළේ කුඩාවැව.** | | | | | |
| 1F | කෝන්ගහඉඩම .. | දෙන් හෙන්ද්‍රික් ගුණසේකර | ආණ්ඩුව .. .. | හේන .. | 0 3 37 | 45 |
| | **මුල් සිතියමේ නො. 2,746. ගම—වැල්ලවායේ කෝන්ගල බින්තැන්නකෝරළේ හම්බේගමුව.** | | | | | |
| 11 | කෝන්ගහවත්ත .. | — .. | ආණ්ඩුව, ජේ. ඇම්. කිරිබංඩා විසින් අයුත්තේ අල්ලාගෙන තිබේ | වත්ත කෙසෙල් පදුරු තිබේ | 0 0 30 | 45 |
| | **අන්තිම ගම් සිතියමේ නො. 318. ගම—වැල්ලවායේ කන්දපල්ලකෝරළේ තිත්තවැල්ගොල්ල.** | | | | | |
| 2D | හපුගස්යායේවත්ත නොහොත් කොලොන්ගහ තැන්නේයාය | — .. | ආණ්ඩුව, ආර්. ඩබ්ලිව්. නියපොත විසින් අයුත්තේ අල්ලාගෙන තිබේ | අවුරුදු 4ක් පරන රබර් තිබේ | 1 2 38 | 100 |
| | **මුල්සිතියමේ නො. 2,607. ගම—බුත්තල වැදිරටකෝරළේ කිඹුලාවෙල.** | | | | | |
| 2 | වැව්අරංවෙවත්ත .. | — .. | ආණ්ඩුව, කිඹුලාවෙල ඔමරු ලෙබ්බේ කච්චා මොහිදීන් බාවා | ඉඩම සම්පූර්ණයෙන්ම කෙසෙල්වලින් වවා තිබේ, මැටි ගහපුගෙයක්ද තිබේ | 0 3 19 | 54 |
| 1 | එම .. | — .. | ආණ්ඩුව, කිඹුලාවෙල ඔමරු ලෙබ්බේ කච්චා මොහිදීන් බාවා විසින් කෙසෙල්වලින් වවහලද ඉඩම, ගලබැද්දේ රත්නායක මුදියන්සේලාගේ හුදුකුමා විසින් උරුම කියනු ලැබේ | බයට ඉතුරුකිරීමට | 0 3 19 | —* |
| | **මුල් සිතියමේ නො. 2,879. ගම—බුත්තලකෝරළේ ඔක්කම්පිටිය.** | | | | | |
| 1 | බුරුතගහවත්ත නොහොත් තෙළඹුගස් වත්ත | — .. | ආණ්ඩුව, ඩී. බංඩාරමැනිකා විසින් අයුත්තේ අල්ලාගෙන තිබේ | ලපුකැලෑව, අඹ ගහක් තිබේ | 0 2 27 | 50 |
| | **මුල් සිතියමේ නො. 2,929. ගම—බුත්තලකෝරළේ අලුත්වෙල.** | | | | | |
| 3 | කන්ඩියේකැලේ .. | අත්තනායක මුදියන්සේලාගේ ගංඇති | ආණ්ඩුව .. .. | හේන .. | 0 3 29 | 40 |
| | **මුල් සිතියමේ නො. 2,969. ගම—බුත්තලකෝරළේ උඩගම.** | | | | | |
| 1 | අම්පිටියේකනත්ත. | — .. | ආණ්ඩුව .. .. | පාරට ඉතුරුකිරීමට | 0 0 3 | —* |
| 2 | එම .. | පී. බී. ජයසිංහබුත්තල කෝරාල | එම .. .. | හේන .. | 2 0 14 | 50 |
| 3 | එම .. | — .. | .. .. | අඹිපාරව ඉතුරුකිරීමට | 0 0 7 | —* |
| | **මුල් සිතියමේ නො. 2,967. ගම—බුත්තලකෝරළේ වගුරේවෙලගම.** | | | | | |
| 1 | ගල්වලේකනත්ත . | — .. | ආණ්ඩුව .. .. | හේන, පාරට ඉතුරු කිරීමට | 0 1 20 | —* |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකම්කියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිළ, රු. |
|---|---|---|---|---|---|---|
| 3 | ගල්වලේකනත්ත .. | — .. | ආණ්ඩුව .. | .. හේන, අත්හැරපු අඩිපාර, ආරට ඉතුරුකිරීමට | 1 0 18 | —* |
| 4 | ජිවුල්ගස්කනත්ත .. | ඒ. ඇම්. කිරි බන්ඩා | එම .. | .. හේන .. | 1 0 5 | 50 |

* මේ බිම්කැබිලි ඉතුරුකිරීමටයි. (විකිණීමට නොවේ.)

මෙහි ඉහත සඳහන් ඉඩම් විකිණීමේ නොහොත් තීන්දුකිරීම ගැන වැඩිදුර කාරණ ඌව පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල් උන්නාන්සේගෙන්ද ලබාගතහැක.

වර්ෂ 1932ක්වූ ජූලි මස 20වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රේන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

ඌව පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1932ක්වූ සැප්තැම්බර් මස 15වෙනි දින පෙරවරු 10ට බදුළු කච්චේරියේදී මෙහි පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ඉල්ලුම්කාර ගම්වැසියන්ට බෝග වවාගැනීමට අවුරුදු 99කට බදුදෙන්ට යෙදෙනවා ඇත.

1. බදුකාරයා විසින් සෑම අවුරුද්දවලම එක එක බිම්කොටසට නියමකර තිබෙන මුල් මුදල හතරට බෙදූ පළමුවෙනි අවුරුද්දේ කොටස ඉඩම් බදුදෙන දවසේ ගෙවන්ට ඕනෑය. ඉතුරු මුදල් කොටස් තුන අවුරුදු පතා තුන් වතාවකින් ගෙවන්ට ඕනෑය.

2. මීට පසු අවුරුද්දකට ශත දහය ගණනේ සෑම අවුරුද්දවලම ඌව පලාතේ ඒජන්ත උන්නාන්සේට බදුළු කච්චේරියේදී ගෙවන්ට ඕනෑය.

3. බදු දුන් අයගේ කැමැත්ත නැතුව මෙම ඉඩම් උකස්කරන්ට හෝ සින්නක්කරයක් දෙන්ට හෝ බද්ද වෙන කෙනෙකුට පවරන්ට හෝ නුපුළුවන.

මෙම ඉඩම්වල බද්දේ වැඩිදුර කොන්දේසි ඌව පලාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරල්තැනගෙන්ද ලබාගත හැකිය.

ඌව පලාතේ බදුළු දිසාවේ යටිකිඳ කොඨාසයේ හල්පේගම පිහිටා තිබෙන බිම්කැබලි 7ක්.

F. V. P. මුල් සිතියමේ නො. 36. ගම—හල්පේ. අයිතිකමකියන්නා—ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිළ, රු. |
|---|---|---|---|---|---|
| 127S | බතලවත්තගොඩහේන | කොවුල්පිටියේගෙදර බී. ඇම්. කිරිබණ්ඩා | වතත, එලවලු වවාතිබේ | 0 3 26 | 100 |
| 69DD35 | නාදකුහින්නේහේන .. | කහටගහවත්තේ ඒ. ඇම්. උක්කුබණ්ඩා | එම .. | 0 3 32 | 100 |
| 69ET | පොල්ගහගොඩපතන | කන්දේකුඹුරේගෙදර වී. ඇම්, කිරිවන්නේ | එම . | 0 3 12 | 100 |
| 69EA / 67CQ | { බටුවත්තගොඩපතන සහ හෙරලිගස්වත්ත } | ආර්. ඇම්. පුංචිරාල .. .. | එම .. | { 0 2 5 / 1 1 7 } | 100 |
| 69EB | පොල්ගහගොඩපතන | ආර්. ඇම්. ගුණසේකර .. .. | එම .. | 1 2 7 | 100 |
| 140B | පොල්ගහකුඹුරේහේන | ජේ. ආර්. ඇම්. බණ්ඩාර .. | එම .. | 0 1 12 | 100 |

වර්ෂ 1932ක්වූ ජූලි මස 19වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රේන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

**Ratnapura No. 44.**—සබරගමු දිසාවේ රත්නපුරේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1932ක්වූ සැප්තැම්බර් මස 20වෙනි දිනවූ අඟහරුවාදා පෙරවරු 10.30ට රත්නපුර කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බේරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. සබරගමු දිසාවේ රත්නපුර දිස්ත්‍රික්කේ කොඨාසයේ පිහිටා තිබෙන බිම්කැබලි 25ක්.

මුල් සිතියමේ නො. 3,956. ගම—කුඹුම්රිය, කුකුළුකෝරළේ—අයිතිකමකියන්නා ආණ්ඩුව.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිළ, රු. |
|---|---|---|---|---|---|
| 2 | නල්ලගස්හේන නොහොත් ඇත්නස්කවත්තේහේන | — .. | ලන්ද .. | 0 1 33 | 40 |
| 3 | එම .. | පී. පොඩිඅප්පුහාමි .. | එම .. | 1 0 1 | 40 |
| | මුල් සිතියමේ නො. 4,102. ගම—මූල්ඇඩියාවල, කොලොන්නාකෝරළේ. | | | | |
| 1 | ලන්දෙකපුගෙපඟුව නොහොත් පින්හේන | — .. | අවුරුදු 12ක පමණවූ වත්ත | 1 2 27 | 60 |
| | අවසාන ගම් සිතියමේ නො. 39. ගම—කරවිට, නවදුන්කෝරළේ. | | | | |
| 42H2 | ආවාරිගෙකුඹුර .. | පී. ඇම්. හිංගිරි මහත්මයා සහ තවත් අය විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කැබෙල්ල | කුඹුර .. | 0 0 22 | 110 |
| 42H3 | ආවාරිගෙදෙනියෙකුඹුර නොහොත් බබල්ගෙදෙනියෙකුඹුර | එම .. | එම .. | 1 0 35 | 110 |
| 42H4 | ආවාරිගෙඔිට නොහොත් බබල්ගෙඔිට | එම .. | අවුරුදු 3ක්වූ කෙසෙල් තිබේ | 0 0 13 | 85 |
| 42H5 | බන්ඩාරවත්ත .. | ඩී. ඒ. ඩබ්ලිව්. තෙන්නකෝන් විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කැබෙල්ල | අවුරුද්දක්වූ වත්ත . | 0 0 11 | 85 |
| 42H6 | කොරටුවෙවත්ත .. | එම සහ තවත් අය .. | අවුරුදු 3 සිට 8 දක්වා වයසැති වගාව තිබෙන වත්ත | 0 2 21 | 85 |
| 42H7 | පිටකොරටුවෙවත්ත .. | වී. ඇම්. දවිතා සහ තවත් අය විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කැබෙල්ල | අවුරුදු 3 සිට 5 දක්වා වයසැති වගාව තිබෙන වත්ත | 0 1 20 | 85 |
| 42H9 | මබොල්ගහවවත්ත නොහොත් ඇලඅද්දරවත්ත | කේ. බී. ජනිසා සහ තවත් අයෙක් විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කැබෙල්ල | අවුරුදු 5 සිට 10 දක්වාවූ වත්ත | 0 2 30 | 85 |
| 42H11 | හින්ඇල .. | — .. | දියපාර .. | 0 0 18 | —* |
| 42H12 | පිටකොරටුවෙවත්ත .. | වී. ඇම්. දවිතා සහ තවත් අය විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් ඉඩම | අවුරුදු 1 සිට 10 දක්වාවූ වත්ත | 1 2 0 | 85 |
| 42H14 | කල්ගස්මුල්ලෙකුඹුර .. | ඩබ්ලිව්. මතෙස්අප්පු සහ අය විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කැබෙල්ල | කුඹුර .. | 0 0 8 | 110 |
| 58AK | එම .. | එම .. | එම .. | 0 0 1 | 110 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|
| | | අවසාන ගම් සිතියමේ නො. 59. ගම—කෙහෙල්ඹිටගම නවඳුන්කෝරළේ. | | | |
| 2BK7 | මිල්ලවිටියවත්ත .. | සීමාසහිත සප්‍රගම් තේ සහ රබර් සමාගම විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කෑබැල්ල | අවුරුදු 8ක් පමණවූ තේ | 0 0 20 | 200 |
| 17½A | ඉඹුල්ඹුරුවවත්ත .. | සීමාසහිත ලංකා එලයන්ඩ් තේ සමාගම විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කෑබැල්ල | අවුරුදු 25ක්වූ රබර් | 0 0 13 | 100 |
| | | අවසානගම් සිතියමේ නො. 197. ගම—බෝපිටිය, නවඳුන්කෝරළේ. | | | |
| 167A | කජුගස්වත්තේහේන නොහොත් ඹිවිටගාවහේන | බී. ඒ. තෝර්න්හිල් මහත්මයා විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කෑබැල්ල | අවුරුදු 8ක්වූ තේ .. | 2 0 2 | 300 |
| 167A3 | එම .. | එම .. | අවුරුදු 8ක්වූ තේ සහ ලැසින් තුනක කොටස්ද අඩංගුමේ | 0 2 22 | 300 |
| 167A6 | එම .. | ජී. අගෝසිංඤෝ විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කෑබැල්ල | කෙසෙල්, මඤ්ඤොක්කා යනාදිය තිබෙන වත්ත | 0 0 3 | —† |
| 167A7 | එම .. | එම .. | එම .. | 0 0 30 | 85 |
| 167A8 | එම .. | කේ. බී. දවිත්අප්පුහාමි විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කෑබැල්ල | එම .. | 0 0 21 | 85 |
| 167A10 | කජුගස්වත්තෙහේන නොහොත් ඹිවිටගාවාහේන නොහොත් ඇපලවත්තෙහේන | ඇන්. පී. කේ. ජෝන් ද මැන්දිස් විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කෑබැල්ල | එම .. | 0 1 2 | 85 |
| 167A12 | කජුගස්වත්තෙහේන නොහොත් ඹිවිටගාවාහේන | ජී. අගෝසිංඤෝ විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කෑබැල්ල | කෙසෙල්, පුවක් යනාදිය තිබෙන වත්ත | 0 0 6 | —† |
| 167A13 | එම .. | එම .. | එම .. | 0 0 6 | 85 |
| 170A | — .. | බී. ඒ. තෝර්න්හිල් මහතා විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කෑබැල්ල | අවුරුදු 8ක්වූ තේ සහ ලැසින් තුනක කොටස්ද අඩංගුවේ | 0 0 5 | 300 |
| 167F1 | හැඩපළුගෙහේනෙවත්ත නොහොත් හීනටිදෙනියේගොඩහේනෙවත්ත | සී. ආර්. ද සිල්වා විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කෑබැල්ල | ගෙයක කොටසක් අඩංගුවත්ත | 0 2 10 | 120 |
| 167F2 | හැඩපළුගෙහේන නොහොත් ආදවලදෙනියේ ගොඩහේන | ජී. කිරිමැනිකා සහ තවත් අය විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කෑබැල්ල | කෙසෙල්, දෙල් සහ පුවක් තිබෙන වත්ත | 0 2 1 | 85 |
| 167F3 | හැඩපළුගේහේන .. | ජී. කිරිමැනිකා විසින් ආණ්ඩුවෙන් අල්ලාගත් බිම්කෑබැල්ල | ඇල්ගොයම් සහ මඤ්ඤොක්කා තිබෙන ඉඩම | 0 1 36 | 70 |

* දියපාර විකුණනු නොලැබේ. † අධිපාර ආරක්ෂක බිම්කැබැල්ල විකුණනු නොලැබේ.

මෙම ඉඩම් සම්බන්ධ වැඩිදුර කාරණා සබරගමු පලාතේ රත්නපුරේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වේයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගන්ට පුළුවන.

වර්ෂ 1932ක්වූ ජූලි මස 20වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රෞන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—බස්නාහිර පුලෝලියේ ප්‍රසිද්ධ වෙළඳ ශාලාවක් පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතරවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් තිසිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 8,028. ගම—බස්නාහිර පුලෝලි.

| නො. | ඉඩමේ නම. | අන්දම | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | උසගෙන .. | මුඩුබිම .. | බස්නාහිර පුලෝලියේ පදිංචි සුප්පිරමනියම් කන්දසියා, කුමාරසාමි වේලායුතර්, වී. ආරුමුකම්ගේ ස්ත්‍රී පොන්නාච්චි, නැසීගියකේ. කදිරිතම්බිගේ ස්ත්‍රී පාරුපති පුල්ලේ, සහ නැසී ගිය ඇන්. විනාසිතම්බිගේ ස්ත්‍රී වල්ලි පුල්ලේ, සහ තවත් අය | 0 1 7·50 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1932ක්වූ අගෝස්තු මස 16වෙනි දින පෙරවරු 10 කනිසම්ම පරිත්තිතුරේ රේච්චවුසියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි. ඉඩම සම්බන්ධවූ ඔප්පුද ඉදිරිපත්කළ යුතුයි.

වර්ෂ 1932ක්වූ ජූලි මස 11වෙනි දින යාපනේ කච්චේරියේදීය.

(අත්සන්කලේ) ඒ. පී. ඩයිසන්,
උතුරු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වෙනුව.

———

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—මුල්ලද්දුවේ කරච්චිකුඩිසිරුප්පුවේ ප්‍රසිද්ධ වැසිකිළියක් සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතරවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවට ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් තිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. 8,189. ගම—මුල්ලද්දුවේ සනීපාරක්ෂක සමිතියේ සීමා තුළ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 2 | පුමාකුලත්තඩිසිල් තෙන් නම්තෝට්ටම් | තල්වත්ත. අවුරුදු 50ක් වයසැති තල්ගස් 7ක් තිබේ | (1) පොන්නම්පලම් කන්දසියා. (2) එම නල්ලසියා, (3) සෙල්ලසියා සින්නතම්බි, (4) එම කනවතිපුල්ලේ, (5) එම තම්බසියා, (6) එම පාරුපතිපුල්ලේ, (7) එම වල්ලිනායකි | 0 0 1·64 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දූනගන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දූනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1932ක්වූ අගෝස්තු මස 31වෙනි දින පෙරවරු 11යේ කනිසමට මෙම කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අයුරෙන් අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දූනගත යුතුයි. ආණ්ඩුවේ උවමනාවක් සඳහා ගන්ට, යෙදුන මෙම දූන්වීම් පත්‍රයේ සඳහන් ඉඩම් කෑල්ල සම්බන්ධ, 29–1–1932 දින නොම් 7,903 දරන ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධවූ 26–1–1932 දින දරන දූන්වීම මෙයින් අවලංගුකරන්ට යෙදුනා ඇත.

වර්ෂ 1932ක්වූ ජූලි මස 11වෙනි දින
මුල්ලදිවුවේ කච්චේරියේදීය.

ආර්. ඇස්. වී. පොලියර්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්ග.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—මඩකලපුව දිස්ත්‍රික්කයේ එරුවිල්යන ගමේ සොහොන් භූමියක් වෙන්කරතැබීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන් වහන්සේගෙන් නියිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. 6,787. ගම—එරුවිල්.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ඊස්වර්සිවන්වත්ත .. | බැද්ද .. | සීමා සහිත ඊස්වර්සිවන් පොල්වතු සමාගම .. | 1 3 26 |
| 2 | එම .. | එම .. | එම .. | 0 0 12 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දූනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දූනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1932ක්වූ අගෝස්තු මස 27වෙනි සෙනි දින පෙරවරු 11යේ කනිසමට මඩකලපුව කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දූනගත යුතුයි.

වර්ෂ 1932ක්වූ ජූලි මස 16වෙනි දින
මඩකලපුව කච්චේරියේදීය.

ඒ. ඇන්. ස්ට්‍රෝං,
නැගෙණහිර දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වර්ග.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—පොල්ගහවෙල, අලව්ව පාර සෑදීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියි ආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

463 දරණ ලංකාමැනීමේ අවසාන සිතියමෙන් උපුටාගන්නාලද නොම්මර 1 දරන කුරුණෑගල දිස්ත්‍රික්කුවේ දඹදෙනිහත්පත්තුවේ උඩුකහ දකුණුකෝරලේ අලව්වේගමේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 105c | අස්වැද්දුමකුඹුර .. | කුඹුර .. | මාපානුත්තයලාගේ පුංචිඅප්පුහාමි, අලව්ව .. | 0 0 3·1 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දූනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දූනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1932ක්වූ අගෝස්තු මස 18වෙනි දින පෙරවරු 10යේ කනිසමට කුරුණෑගල කච්චේරියේදී ම ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දූනගත යුතුයි.

වර්ෂ 1932ක්වූ ජූලි මස 13වෙනි දින
කුරුණෑගල කච්චේරියේදීය.

ජේ. ආර්. වෝල්ටර්ස්,
වයඹ දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත වර්ග.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3නේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—බදුල්ලේ ජලසම්පාදනය දියුණුකිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියිආකාර මට අණලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

මුල් සිතියමේ නො. 2,974. ගම—බදුල්ලේ නාගරික සීමාවතුළ අලුත්වෙලගම.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | කහවත්ත (වරිපනම් නො. 16 දරණ) | හේන (පරන වත්තක කෑල්ලක්) .. | බංඩාරවෙල අඹේගොඩ පදිංචි රත්නායකමුදියන්සේලාගේ උක්කුමැණිකා | 0 0 3·32 |
| 2 | — .. | අඹිපාර (පරණ වත්තක කෑල්ලක්) .. | එම .. | 0 0 1·17 |
| 3 | කහවත්ත (වරිපනම් නො. 16 දරණ) | මුඩුබිම (පරණ වත්තක කෑල්ලක්) පැල උනපඳුරු 2ක්ද, පැල කැකුණගහක් සහ පැල රිටිගහක්ද තිබේ | එම .. | 0 0 2·06 |
| 4 | — .. | අලුත් ජලනල පාර (පරණ වත්තක කෑල්ලක්) | එම .. | 0 0 2·65 |
| 5 | කහවත්ත (වරිපනම් නො. 16 දරණ) | මුඩුබිම (පරණ වත්තක කෑල්ලක්) අවුරුදු 5ක් පරණ දෙඩම්ගහක් තිබේ | එම .. | 0 0 2·22 |
| 6 | අඹගහමුල්ලේවත්ත (වරිපනම් නො. 14A දරණ) | මුඩුබිම (පරණ වත්තක කෑල්ලක්) .. | බදුල්ලේ ඇන්. ඕරසිංහ මැතිනිය | 0 0 0·37 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දූනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දූනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1932ක්වූ අගෝස්තු මස 23වෙනි දින පෙරවරු 10යේ කනිසමට බදුල්ල කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒව ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දූනගත යුතුයි.

වර්ෂ 1932ක්වූ ජූලි මස 18වෙනිදින
බදුල්ල කච්චේරියේදීය.

ඩී. ඒ. තොම්සන්,
ඌවේ ආණ්ඩුවේ ඒජන්ත වර්ග

---

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.